# විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමයින්ගේ සංවර්ධනය උදෙසා දෙමාපිය මැදිහත්වීම වර්ධනය කරන කාර්ය මූලික පර්යේෂණය

අධ්‍යාපනපති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන
ස්වාධීන පර්යේෂණ නිබන්ධනය


ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

අධ්‍යාපන පීඨය

නාවල

එච්. කේ. අයි. ඒ. ගුණසේකර

309080887

අධ්‍යාපනපති උපාධි පාඨමාලාව,

2013



OPEN UNIVERSITY

70884

070884

# අධ්‍යයන සාරාංශය

විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ සංවර්ධනය උදෙසා දෙමාපිය මැදිහත්වීම සංවර්ධනය කරන කාර්යය මූලික පර්යේෂණය තෝරාගත් විශේෂ අධ්‍යාපන ඒකකයේ සිටින විවිධ ඌණතාවයන් සහිත දරුවන් දසදෙනෙක් සහ ඔවුන්ගේ දෙමාපියන් දසදෙනෙක් විශේෂ අධ්‍යාපන ඒකකය භාර ගුරුවරයාත් සහභාගි කරගෙන ක්‍රියාත්මක කරන ලදි. මෙම පර්යේෂණය සුවිශේෂී අරමුණු හතරක් ඔස්සේ ක්‍රියාත්මක කළ අතර මැදිහත්වීමේ වැඩසටහන පියවර හතරකින් සමන්විත විය. මැදිහත්වීමට පෙර දෙමාපියන් තම දරුවන්ගේ කටයුතු හා අවශ්‍යතාවයන් සඳහා ඇති දැනුවත් බව හා මැදිහත්වීමේ ප්‍රමාණය නිරීක්ෂණය, ප්‍රශ්නාවලි, හා සම්මුඛ සාකච්ඡා මගින් තොරතුරු රැස් කර විමසා බැලූ අතර දෙමාපිය නියැඳියෙන් බහුතරයක් තම දරුවාගේ ඌණතාවය පිළිබඳ නිසි අවබෝධයක් නොතිබූ අතර පාසල් රැගෙන ඒම, දරුවාගේ අධ්‍යාපන කටයුතු වලට උපකාර කිරීම, දෛනික හා සමාජානුයෝජන කටයුතු සඳහා උපකාර කිරීම අඩු මට්ටමක පැවතුණි. ඒ අනුව මැදිහත්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. පළමු පියවර යටතේ තම දරුවාගේ අවශ්‍යතාවන් පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහනත්, දෙවන පියවර යටතේ දෙමාපියන් හා දරුවන් සම්බන්ධ කරමින් ප්‍රායෝගික වැඩසටහනත්, තුන්වන පියවර යටතේ ගුරුවරයාත් දෙමාපියන් සම්බන්ධ කළ හැකි අවස්ථා නිර්මාණය කිරීමත් අවසන් පියවර යටතේ දෙමාපිය උපකාර සහිතව දරුවන්ට ගෙදර වැඩ පැවරීමත් සිදු කෙරිණි. මැදිහත් වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව දෙමාපිය මැදිහත්වීමේ සංවර්ධනය පෙර පරිදි නිරීක්ෂණය, ප්‍රශ්නාවලි, හා සම්මුඛ සාකච්ඡා මගින් විමසා බලන ලදි. ඒ අනුව දෙමාපියන් තම දරුවන්ගේ අධ්‍යාපන, සමාජීය, චිත්තශක්තිය හා කායික සංවර්ධනය පිළිබඳව සතුටුදායක මැදිහත්වීමක් පෙන්නුම් කරන ලදි. පර්යේෂණය ක්‍රියාත්මක කිරීමේ දි අනාවරණය කරගන්නා ලද තොරතුරු අනුව පර්යේෂණ යෝජනාවන් සකසන ලදි. ඒ අනුව දෙමාපිය සංවර්ධන උදෙසා ක්‍රියාත්මක කරන ලද මෙම පර්යේෂණය මඟින් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ සංවර්ධනය සඳහා එය සාර්ථක දායකත්වයන් සපයා දි ඇත.

# Abstract

This is implemented for the development of 10 kids who are in need of especial attention with participation of 10 parents selected centered at their development who are found in special education unit. This project was implemented under four main objectives and participation consisted with four steps. Parents' awareness of their children's' activities, frequencies of participation are supervised before the process, questionnaires and discussions were held before hand. Majority of parents didn't have any understanding of the deficiencies of their children and most of them hadn't helped their children to improve their studies; bringing them to school, their social activities or day to day life. The program implemented in accordance with this. The first step, educated parents, how to understand what their children need, and the second step was practical, combining parents and children more closely. The third step created opportunities to combine parents and teachers, and the last step was providing homework for children under assistance of parents. Parent participation was examined through questioning and discussions as usual at implementing participation program, and this process indicated their comprehension attention, enthusiasm has developed into a satisfactory level. Project Report was prepared in accordance with data collected at the project. This enables to develop children's need development of parents.